කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

MINISTRY OF LABOUR AND FOREIGN EMPLOYMENT




# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# PROGRESS REPORT 2023

# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

# Ministry of Labour and Foreign Employment

# ප්‍රගති වාර්තාව

## முன்னேற்ற அறிக்கை

# Progress Report

# 2023

# වැය ශීර්ෂ අංක - 193

## செலவினத் தலைப்பு – 193

## Expenditure Head - 193

සියලු හිමිකම් ඇවිරිණි / அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை /
All rights reserved

2023 නොවැම්බර් / 2023 **நவம்பர்** / November 2023

**ප්‍රකාශනය /** வெளியீடு **/ Publication**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Labour and Foreign Employment

7 මහළ, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05
7 ஆவது தளம், 'மெஹெவர பியெச'நாரஹேன்பிட்டிகொழும்பு–05
7th Floor, "Mehewara Piyasa", Narahenpita, Colombo 05

දුරකථනය / தொலைபேசி / Telephone : 011 2581991

## අන්තර්ගතය பொருளடக்கம **CONTENTS**

## I කොටස


| | | | |
|---|---|---|---|
| 1. පළමු පරිච්ඡේදය | - | හැඳින්වීම | 1 – 13 |
| 2. දෙවන පරිච්ඡේදය | - | අමාත්‍යාංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය | 14 –66 |
| 3. තෙවන පරිච්ඡේදය | - | අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සහ ක්‍රියාකාරකම් | 67 –78 |


## பகுதி II


| | | | |
|---|---|---|---|
| 1. முதலாம் அத்தியாயம் | – | அறிமுகம் | 79 - 96 |
| 2. இரண்டாம் அத்தியாயம | – | அமைச்சினால் அடையப்பட்டுள்ள முன்னேற்றம் | 98 - 158 |
| 3. மூன்றாம் அத்தியாயம | – | அமைச்சின் எதிர்காலத் திட்டங்கள் மற்றும் செயற்பாடுகள | 159 - 171 |


## Section III


| | | | |
|---|---|---|---|
| 1. Chapter One | - | Introduction | 173 - 186 |
| 2. Chapter Two | - | Progress made by the Ministry | 187 - 244 |
| 3. Chapter Three | - | Future Plans and activities of the Ministry | 245 - 259 |

# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
# தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
# Ministry of Labour and Foreign Employment

## ප්‍රගති වාර්තාව
## முன்னேற்ற அறிக்கை
## Progress Report
## 2023

**I කොටස - සිංහල භාෂාව**

பகுதி I – **சிங்கள மொழி**

Section I - Sinhala Language

# කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



නව ආරක වැඩ සංස්කෘතියක් බිහි කිරීම තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කොට, ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා දියත් කර ඇති වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන කර්යභාරයෙහි 2023 වසරේ සැප්තැම්බර් මස 30 වන දිනට අත්පත් කර ගත් ප්‍රගතිය හා ඉතිරි කාලසීමාවේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ඇතුළත් වන මෙම ප්‍රකාශනයට මාගේ පණිවිඩය එක් කරනුයේ ඉමහත් සතුටිනි.

කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නෛතික හා ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය කොට, වර්තමාන ගෝලීය ආර්ථික, සමාජීය හා සංස්කෘතික තත්වයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමත් එමඟින් ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමට උර දීමත් මා හට පැවරී ඇති ප්‍රමුඛ වගකීමකි. ඒ අනුව, නව සේවා නියුක්ති පනතක් සකස් කොට ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම, විගමන ශ්‍රමිකයින්ගේ සුරක්ෂිතතාවය හා සුභසාධනය වෙනුවෙන් "රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරි සැලැස්ම 2023 සිට 2027" ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් මහජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් කෙටිකාලයක් තුළ ඉතා පහසුවෙන් ලබා දීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. එමෙන්ම, ජාතික ශ්‍රම වෙළඳපොළ සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කොට ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් විසින් මෙම අමාත්‍යාංශය වෙත පවරන ලද, වාර්ෂිකව විදේශ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමේ ඉලක්කය කරා මේ වන විට ළඟා වෙමින් පවති. ඒ සඳහා දිරි ගැන්වීම් ලෙස එතෙර රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයින් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම, එම විගමනික ශ්‍රමිකයන් මෙරටට පැමිණීමේ දී අතිරේක තීරු බදු සහන ලබා දීම, ඔවුන්ගේ ප්‍රේෂණ පදනම් කර ගනිමින් සහනදායි ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම වැනි වැඩසටහන් මඟින් විගමනික ශ්‍රමිකයන් උපයන ආදායම රටේ ආර්ථික ක්‍රියාවලිය තුළට පූර්ණව හා නිත්‍යානුකූලව ඇතුළත් කර ගැනීමට අනුබල දෙනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේ අගෝස්තු මාසයේ දී මෙරට විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඇ.ඩො. මිලියන පන්සියයක් දක්වා වර්ධනය කර ගත හැකි විය.

නිත්‍යානුකූල විගමනය දිරි ගන්වනු වස් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් රැකවරණ, සුභසාධන හා ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහභාගීත්වයෙන් යෝජිත නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සහයෝගීත්වයෙන් විදේශ රැකියා නියුක්තිකයින්ගේ දරුවන්ට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමට යෝජිත වැඩසටහන, ඔවුන්ගේ දරුවන්ට දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විගමනික සමාජ පිහිටුවීමේ ව්‍යාපෘතිය වැදගත් වේ. එමෙන්ම, විදේශ රැකියා ක්ෂේත්‍රයේ රැකියාවලට අවශ්‍ය හා සුදුසු පුහුණුව නොමැති වීමේ හෝ ප්‍රමාණවත් නොවීමේ ගැටලුවට විසඳුමක් ලෙස වෘත්තිය පුහුණු අධිකාරිය සමඟ ගිවිසුම් ගතව නිපුණ ශ්‍රමිකයන් විදේශ රැකියා වෙළඳපොළට යොමු කිරීමට කටයුතු කර ඇත.

ඉල්ලුම හා ආදායම් ඉපයීමේ ශක්‍යතාවය ඉතා ඉහළ නමුත් ශ්‍රමික ගරුත්වය හා සුරක්ෂිතතාව පහළ මට්ටමක පවතින වෘත්තීන්ට ශ්‍රී ලංකික වෙළඳ පොළෙහි නිසි තැන ලබා දීමේ වැදගත්කම හඳුනා ගෙන ඇති අතර මේ සඳහා අරඹන ලද ‘Dignity of Labour’ (ගරු සරු) වැඩසටහන නව්‍ය හඳුන්වා දීමක් වේ. මෙමඟින් වෘත්තිය බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමට අපේක්ෂිත අතර ජපාන ආකෘතියට අනුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජිතය.

2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව 'ළමා ශ්‍රමයෙන් තොර රටක්' ලෙස තහවුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ජාත්‍යන්තර මට්ටමට පුළුල් කිරීම මඟින් වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය තහවුරු කළ අනතුරු රහිත වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා සේව්‍ය, සේවක දෙපාර්ශවය යොමු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතියි. එමෙන්ම, සේවකයින්ගේ සමාජ ආරක්ෂණය වර්ධනය සඳහා සේවා වියුක්ති ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ හා වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම වැනි කාර්යයන් සේවායෝජකට අමතර වැය බරක් නොවන පරිදි ලබා දීම සඳහා නව සමාජ ආරක්ෂණ අරමුදලක් ස්ථාපනයට අපේක්ෂිතය.

අමාත්‍යාංශය, අනුබද්ධිත ආයතන හා සමගාමී සේවාවන්, සේවාලාභීන් පදිංචි ප්‍රදේශ තුළ දී ලබා දීම අරමුණු කරගෙන ‘GLOCAL FAIR’ ජංගම සේවා වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලද අතර එතුළින් සේවාලාභීන්ට අවම සංචරණයක් තුළින් කම්කරු ගැටලු විසඳා ගැනීම, විදේශ රැකියා අවස්ථා ලබා ගැනීම ඇතුළු සියලු සේවාවන් ලබා ගැනීමට හැකි විය.

මෙලෙසින්, අප අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සියලු කර්තව්‍යයන් ප්‍රධාන නිමැවුම් ක්ෂේත්‍ර 10ක් ඔස්සේ හඳුනාගෙන ඇත. එම ව්‍යාපෘතීන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනවල මඟ පෙන්වීම හා සහයෝගීත්වය ලැබී ඇති අතර දේශීය වශයෙන් සේව්‍ය - සේවක දෙපාර්ශවය නියෝජනය කරන සංවිධානවල අනුග්‍රහය හා සහයෝගීත්වය හිමි වේ. මෙම සුවිශාල කාර්යභාරය ඉටු කිරීමෙහිලා උරදෙන විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට හා අමාත්‍යාංශ ලේකම් ආර් පී ඒ විමලවීර මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**මනූෂ නානායක්කාර (පා.ම.)**
**කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය**

## විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



අප රටට දැනට ලැබෙන විදේශ විනිමය අර්බුදයෙන් මිදීම සඳහා විදේශ විනිමය ගෙන එන ප්‍රධානතම මාර්ගයක් වන්නේ විදේශ ශ්‍රමිකයින්ගෙන් නීත්‍යානුකූල මාර්ගවලින් රටට ලැබෙන විදේශ ප්‍රේෂණ වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 ඔක්තෝබර් මාසයේ නිකුත් කරන ලද නිකුතුවට අනුව 2022 වර්ෂයේ මුල් කාර්තු තුන තුළ විගමනිකයින්ගෙන් ලත් විදේශ ප්‍රේෂණ ප්‍රමාණය වන ඩොලර් මිලියන 2,574 හා සසඳන විට 2023 වසරේ එම කාලය තුළ ඩොලර් මිලියන 4,345 ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇති අතර එය 69% ක පමණ වැඩිවීමකි.

විදේශ රැකියා ප්‍රවර්ධනය සහ විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම එක්ව විශාල වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබයි. තවද, විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ විදේශ රැකියා නිම කර නැවත මෙරටට පැමිණි විගමනිකයින්ගේ ආරක්ෂාව හා සුබසාධනය උදෙසා දැනුවත් කිරීම, ස්වයං රැකියා හා නැවත සමාජගත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන් අතර ශ්‍රමික පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම, පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීම, වෘත්තීය පුහුණු අවස්ථා සඳහා යොමු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන අතර මෙම වැඩසටහන් බිම් මට්ටම දක්වා රැගෙන ගොස් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසිනි.

විගමනික ශ්‍රමිකයින් සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි මට්ටමින් සිදු කිරීමත් විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉදිරි ගමන් මග සාර්ථක කර ගැනීම සඳහා පළාත් මට්ටමින් අවශ්‍ය සහාය හා අදහස් ලබා ගැනීම සඳහාත් මාගේ ප්‍රධානත්වයෙන් පළාත් මට්ටමින් සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලබයි.

ගරු කැබිනට් අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුලු නිල මඩුල්ල හා අමාත්‍යාංශය යටතේ වන ආයතනවල ප්‍රධානීන් ඇතුලු සියලු නිලධාරීන්ටගන් මේ සඳහා වන දායකත්වය අගය කරමි.

**ජගත් පුෂ්පකුමාර (පා.ම.)**
**විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය**

## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම, ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම හා රට තුළ කාර්මික සාමය ස්ථාපනය සහ විදේශීය රැකියා වෙළඳපොළ වෙත නිපුණ ශ්‍රමිකයින් යොමු කිරීම යන ක්ෂේත්‍රයන් ඔස්සේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට සිදු කළ ඵලදායී කාර්යභාරය හා 2024 වර්ෂයට සැලසුම්ගත කාර්යභාරයන් පිළිබඳව සකස් කරනු ලබන ප්‍රගති වාර්තාව ඔබ වෙතට පත් කරනුයේ මහත් අභිමානයෙනි.

වර්තමාන මෙන්ම අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා සහ වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීමට අණපනත් සංශෝධනය කිරීම 2023 වසර තුළ අප අමාත්‍යාංශය ඉටු කළ ප්‍රමුඛ කාර්යයකි. පවතින අණපනත්, නීතිරීති වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කරන අතරම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. දැනට ක්‍රියාත්මක පනත් 13ක ප්‍රතිපාදන ඇතුලත් කරමින් නව සේවා නියුක්ති පනත් කෙටුම්පතක් සකස් කිරීමට කටයුතු කර ඇති අතර එය අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත.

විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්ධනය, ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ වෙනස්වීම්වලට අනුගත වන පරිදි විදේශ රැකියා ක්ෂේත්‍රය විධිමත් කිරීම, පවතින නෛතික රාමුව ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර බැඳීම්වලට අනුගත වීම සඳහා සහ දේශීය වශයෙන් නීති ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය සහ ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සංස්කෘතියක් ඇති කර සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න හා වෘත්තීය අනතුරු අවම වන වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පනත සංශෝධනය කිරීමේ කටයුතු සියයට පනහකින් පමණ අවසන් කර ඇත.

සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වර්ධනය කර අන්තර්ජාලය මඟින් සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඩිජිටල්කරණය කිරීමට සහ කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙනු ලබන සේවාවන් ඩිජිටල්කරණය සඳහා මූලික කටයුතු අරඹා ඇත. ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම තුළින් නම්‍යශීලී ක්‍රියාපටිපාටි, ඩිජිටල් හා ස්වයංක්‍රීය විසඳුම් හරහා සේව්‍ය/ සේවක දෙපාර්ශවයටම පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි අඩු පිරිවැයකින් සේවා සැපයීමට අපේක්ෂිතය.

එසේම, විදේශ රැකියා වෙළඳපොළ සඳහා නව තාක්ෂණික දැනුම සහ කුසලතාවයන් සහිත නිපුණතා පූර්ණ ශ්‍රමිකයන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන සාම්ප්‍රදායික විදෙස් ශ්‍රම වෙළඳපොළ ඇති රටවලට අමතරව, නව ශ්‍රම වෙළඳපොළ වෙත ශ්‍රමිකයන් යැවීම හා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ග්‍රහණය කර නොගත් රටවල් සඳහා ශ්‍රමිකයන් යොමු කිරීම සඳහා එම රටවල් සමඟ එකඟතාවයක් ඇති කර ගැනීම අඛණ්ඩව සිදු කරනු ලැබේ. විදේශ ප්‍රේෂණ නීත්‍යානුකූල මාර්ගයෙන් එවීම උනන්දු කිරීම සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයන බලපත්‍ර ලබා දීම, ගුවන් තොටුපළේ දී අතිරේක තීරු බදු සහන ලබා දීම වැනි වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත. විගමනික ශ්‍රමිකයින් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම තුළින් ඔවුන්ගේ සුභසාධනය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

සමාජයේ නිල් කරපටි රැකියාවන් ලෙස හඳුනාගෙන ඇති වෘත්තීන්වලට අභිමානයක් ඇති වන පරිදි ඔවුන්ගේ සේවා තත්වයන් උසස් මට්ටමින් සිදු කිරීම සඳහා මඟ පෙන්වීමට හා වෘත්තීය මාර්ගෝපදේශ හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. රටේ සංවර්ධනයට දායක වන ඵලදායි මානව සම්පතක් ගොඩනැගීම උදෙසා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය මඟින් ප්‍රබල දායකත්වයක් ලබාදේ.

එමෙන්ම, අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ විදේශ රැකියා ඒජන්සිය මඟින් සේවක සුභසාධනය, කම්කරු නීති රීති පිළිබඳව දැනුවත් කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතා ප්‍රවර්ධනය, ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සංස්කෘතියක් ඇති කර සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න හා වෘත්තීය අනතුරු අවම වන වැඩ පරිසරයක් ඇති කිරීමට මෙන්ම විදේශ රැකියා සඳහා පුද්ගලයන් යොමු කිරීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය, මඟපෙන්වීම හා අනුශාසකත්වය ලබා දුන් කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමන්ට හා ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට කෘතඥතාවය පළ කරමි. මෙම කාල පරිච්ඡේදය තුළ ඉහත කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් ඇතුලු කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රම වාසනා අරමුදල හා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම යන ආයතනවල සාමාන්‍යාධිකාරීවරුන්ට සහ එම ආයතනවල සියලුම මට්ටම්වල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**ආර් පී ඒ විමලවීර**
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## පටුන


### පළමු පරිච්ඡේදය - හැඳින්වීම

1 කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

1.1 හැඳින්වීම........ 2
1.2 දැක්ම සහ මෙහෙවර........ 2
1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්........ 2
1.4 අමාත්‍යාංශය යටතේ පවතින අංශ........ 3
1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන........ 6
1.5.1 කම්කරු දෙපාර්තමේන්තුව........ 6
1.5.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය........ 7
1.5.3 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව........ 8
1.5.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය........ 9
1.5.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය........ 9
1.5.6 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය........ 10
1.5.7 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය........ 10
1.5.8 ශ්‍රම වාසනා අරමුදල........ 11
1.5.9 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම........ 12
1.6 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය........ 13

### දෙවන පරිච්ඡේදය

2 අමාත්‍යාංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය........ 15
2.1 සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරීම........ 15
2.2 විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික සහ ප්‍රතිපත්ති රාමුව සවිමත් කිරීම........ 17
2.2.1 1985 අංක 21 දරණ විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම........ 17
2.2.2 රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සහ විෂයපථය පුළුල් කිරීම........ 17
2.3 විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකිකයින් විසින් උපයන මුදල් නීත්‍යානුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීමට කටයුතු කිරීම........ 17
2.3.1 එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම........ 17
2.3.2 රැකියා සඳහා විදේශගතව සිට නැවත පැමිණෙණ විගමනික ශ්‍රමිකයින් සඳහා අතිරේක තිරු බදු සහන ලබා දීම........ 17
2.3.3 දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම........ 18
2.3.4 ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් හට ගුවන් තොටුපල තුළදී වැඩි පහසුකම් ලබා දීමේ අරමුණින් “බලාපොරොත්තුවේ දොරටුව” (HOPE GATE) විවෘත කිරීම........ 18
2.4 ශ්‍රමයේ අභිමානය (Dignity of Work) වර්ධනය කරීම........ 18
2.5 ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම........ 18
2.5.1 ශ්‍රම බලකාය බලගැන්වීම සහ ආරක්ෂා කිරීම........ 18
2.5.2 ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම........ 19
2.6 ජාත්‍යන්තර සහයෝගීතාවය තුළින් විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම........ 21

2.6.1 අවබෝධතා ගිවිසුම් / එකඟතා........ 21
2.6.2 ගෝලීය / කලාපීය සංසද........ 22
2.6.3 විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය........ 23
2.7 විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම, සුභසාධනය හා සවිබල ගැන්වීම ........ 24
2.7.1 විදේශ රැකියා අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්........ 24
2.7.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්........ 29
2.8 ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම........ 33
2.8.1 සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම........ 33
2.8.2 කම්කරු පරීක්ෂණ සිදු කිරීම........ 34
2.8.3 ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම........ 34
2.8.4 වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත්වීම් සිදු කිරීම........ 36
2.8.5 සාමූහික ගිවිසුම් සඳහා සේව්‍ය හා සේවක දෙපාර්ශවය පෙළඹවීම........ 36
2.8.6 බේරුම්කරණ කටයුතු සිදු කිරීම........ 36
2.8.7 වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම........ 36
2.9 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම........ 37
2.9.1 දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම........ 37
2.9.2 සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම්........ 37
2.9.3 පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම ........ 37
2.9.4 අණපනත් සම්බන්ධයෙන් සේව්‍ය හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම........ 38
2.10 සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම........ 38
2.11 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්........ 39
2.12 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම........ 40
2.12.1 ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම........ 40
2.12.2 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ........ 40
2.12.3 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම........ 40
2.12.4 ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීමට අදාළව 2023 වර්ෂය තුළ දී සිදු කරනු ලැබූ වැඩසටහන් පිළිබඳ තොරතුරු........ 41
2.12.5 ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම........ 41
2.13 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය........ 42
2.13.1 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම........ 42
2.13.2 දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාළව නිවේදන යැවීම........ 42
2.13.3 සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සඳහා සහ සේවාලාභීන් වෙත සේවා ලබා දීමේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග 43
2.14 සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය........ 44
2.15 කම්කරු දෙපාර්තමේන්තුවේ තොරතුරු සන්නිවේදන කටයුතු........ 45
2.15.1 ප්‍රකාශන කටයුතු........ 45
2.15.2 කම්කරු දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු........ 46

2.15.3 කම්කරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය.............................................. 46
2.15.4 කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය......................................... 46
2.16 කම්කරු දෙපාර්තමේන්තුවේ මානව සම්පත සංවර්ධනය.................................... 47
2.17 කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය............................... 49
2.18 කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් කරා මෙහෙයවීම.................................................................................................. 49
2.19 විදේශ රැකියා ක්ෂේත්‍රයේ පාලනය හා නියාමනය............................................. 50
2.20 විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය...................................................................... 52
2.20.1 අන්තර්ජාලගත රැකියා බැංකුව.......................................................... 52
2.20.2 සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම...................................................... 52
2.21 වෘත්තීය මාර්ගෝපදේශනය, ශ්‍රම වෙළඳපොළ තොරතුරු පවත්වා ගැනීම හා මහජන රැකියා සේවා කටයුතු.......................................................................... 53
2.21.1 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්.......................................................... 53
2.21.2 රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා මහජන රැකියා සේවා වැඩසටහන්........... 53
2.21.3 ප්‍රතිපත්ති හා තොරතුරු තාක්ෂණ වැඩසටහන්....................................... 54
2.22 වඩා හොඳ කාර්මික සබඳතා සඳහා ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් දැනුවත් කිරීම... 55
2.22.1 කම්කරු නීතිය, කාර්මික සබඳතා සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය.......................................................................................... 55
2.22.2 වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම............................... 57
2.23 වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම.................................................................. 58
2.24 රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම.............................. 59
2.25 ශ්‍රමිකයින්ගේ සුභසාධනය.............................................................. ............ 61
2.26 විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම....................................................... 62
2.27 සුනිසි මෙහෙවර වැඩසටහන.............................................................................. 63
2.28 සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.......................................................... 64
2.29 පාලන සහ ආයතන කටයුතු................................................................................ 64
2.30 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය.......................................................................... 65

## තෙවන පරිච්ඡේදය

3 අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සහ වැඩසටහන්............................................ 68
3.1 කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය........................................................ 68
3.2 කම්කරු දෙපාර්තමේන්තුව.......................................................................... 72
3.3 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය..................................................... 73
3.4 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව....................................................... 74
3.5 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය......................................................................... 74
3.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය.......................................... 75
3.7 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය........................................................... 76
3.8 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය............................................................. 76
3.9 ශ්‍රම වාසනා අරමුදල.......................................................................................... 77
3.10 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි(පුද්.) සමාගම................................................... 78

වගු නාමාවලිය


| | | |
|---|---|---|
| වගුව 1-1 | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය.................................................. | 13 |
| වගුව 2.1 | රැකියා පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.............................................. | 29 |
| වගුව 2.2 | විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ සුභසාධන වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා..................................................................................... | 30 |
| වගුව 2.3 | විගමනික ශ්‍රමිකයන්ගේ දූදරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම - ශ්‍රී. ලං. වි. සේ. නි. කා......................................................................................... | 31 |
| වගුව 2.4 | පුහුණු වැඩසටහන් පැවැත්වීම - ශ්‍රී. ලං. වි. සේ. නි. කා............................... | 31 |
| වගුව 2.5 | කම්කරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්.......................................................................................... | 33 |
| වගුව 2.6 | වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - කම්කරු දෙපා.................................. | 36 |
| වගුව 2.7 | ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම - සේ. අ. අ., කම්කරු දෙපා................ | 44 |
| වගුව 2.8 | අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - කම්කරු දෙපා............................ | 44 |
| වගුව 2.9 | නිලධාරීන් බඳවා ගැනීම - කම්කරු දෙපා..................................................... | 47 |
| වගුව 2.10 | නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් - කම්කරු දෙපා.......................................................................................................... | 49 |
| වගුව 2.11 | කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය......................... | 49 |
| වගුව 2.12 | විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත් නිකුත් කිරීම්, විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා.................................................................................... | 50 |
| වගුව 2.13 | විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා.................................................... | 51 |
| වගුව 2.14 | විගමනික ශ්‍රමිකයන් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම සහ මිනිස් වෙළඳාමට එරෙහි ක්‍රියාකාරම් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා......... | 51 |
| වගුව 2.15 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ රැකියා සඳහා බඳවා ගැනීම - ශ්‍රී. ල. වි.සේ.නි.කා........................................................... | 52 |
| වගුව 2.16 | විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.- ශ්‍රී.ලං.වි.සේ.නි.කා........... | 52 |
| වගුව 2.17 | වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් - මි.හා ර.ර.දෙපා.............................. | 53 |
| වගුව 2.18 | රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා මහජන රැකියා සේවා වැඩසටහන් ............... | 53 |
| වගුව 2.19 | ප්‍රතිපත්ති හා තොරතුරු තාක්ෂණ වැඩසටහන් - මි.හා ර.ර.දෙපා................ | 54 |
| වගුව 2.20 | ඩිප්ලෝමා වැඩසටහන් - ජා.ශ්‍ර.අ.ආ. ....................................................... | 55 |
| වගුව 2.21 | සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ පැවැත් වූ පාඨමාලාවන්හි ප්‍රගතිය - ජා.ශ්‍ර.අ.ආ....................................................................................... | 55 |
| වගුව 2.22 | වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් - ජා. වෘ. සු. හා සෞ. ආ. ........................................................................................ | 57 |
| වගුව 2.23 | වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය - කම්. වන්දි.කො.කාර්........................ | 58 |
| වගුව 2.24 | ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්හි ප්‍රගතිය - ජා.ඵ.ලේ.කාර්...... | 59 |
| වගුව 2.25 | ආසියානු ඵලදායිතා සංවිධානයේ අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්හි ප්‍රගතිය - ජා.ඵ.ලේ.කා....................................... | 60 |
| වගුව 2.26 | ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්හි ප්‍රගතිය - ජා.ඵ.ලේ.කාර්...... | 60 |
| වගුව 2.27 | කම්කරු ප්‍රජාව සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - ශ්‍ර.වා.අර.. | 61 |
| වගුව 2.28 | විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව - ශ්‍රී.ලං.වි.ර.ඒ.(පුද්).සමා......................... | 62 |
| වගුව 2.29 | සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම ...................................... | 63 |
| වගුව 2.30 | ආයතන කටයුතුවල ප්‍රගතිය ..................................................................... | 65 |
| වගුව 2.31 | භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය................................ | 66 |
| වගුව 3.1 | විදේශගත කිරීමට අපේක්ෂිත රැකියා ඇණවුම් - ශ්‍රී.ලං.වි.ර.ඒ.(පුද්).සමා..... | 78 |

**ප්‍රස්තාර නාමාවලිය**


| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | ශ්‍රමික සුරැකුම යටතේ ලියාපදිංචිය ................................................ | 25 |
| ප්‍රස්තාරය 2.2 | සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද පවුල් සංවර්ධන සහ රැකවරණ සැලසුම් ........................................................................ | 25 |
| ප්‍රස්තාරය 2.3 | 2019 වර්ෂයේ සිට 2023.06.30 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - කම්කරු දෙපා........................................................................................ | 35 |
| ප්‍රස්තාරය 2.4 | 2019 වර්ෂයේ සිට 2023.06.30 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම් - කම්කරු දෙපා........................................................................................ | 35 |
| ප්‍රස්තාරය 2.5 | සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම - කම්කරු දෙපා......... | 43 |
| ප්‍රස්තාරය 2.6 | මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - කම්කරු දෙපා............................................................................... | 45 |
| ප්‍රස්තාරය 2.7 | 2023.01.01 - 2023.09.30 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය........................................................................................ | 58 |
| ප්‍රස්තාරය 2.8 | 2023.01.01 - 2023.09.30 දක්වා වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය.. | 58 |


**රූප සටහන් නාමාවලිය**


| | | |
|---|---|---|
| රූප සටහන 1.1 | කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය ............................................. | 7 |
| රූප සටහන 1.2 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යුහය....................... | 8 |
| රූප සටහන 2.1 | ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ....................................... | 15 |
| රූප සටහන 2.2 | කම්කරු පරීක්ෂණ සිදු කිරීම - කම්කරු දෙපා.................................. | 34 |
| රූප සටහන 2.3 | දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම සිදු කිරීම-කම්. දෙපා..... | 37 |
| රූප සටහන 2.4 | සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම - කම්කරු දෙපා........................................................................................ | 37 |
| රූප සටහන 2.5 | පඩි පාලක සභා ආඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම - කම්කරු දෙපා................................................................ | 37 |
| රූප සටහන 2.6 | අණපනත් සම්බන්ධයෙන් සේව්‍ය හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම - කම්කරු දෙපා.......................................................................... | 38 |
| රූප සටහන 2.7 | අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය - කම්කරු දෙපා................................................................................ | 38 |
| රූප සටහන 2.8 | සෞඛ්‍ය හා සුරක්ෂිතතාව සම්බන්ධ පරීක්ෂණ - කම්කරු දෙපා......... | 39 |
| රූප සටහන 2.9 | ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම - කම්කරු දෙපා........................................................................................ | 40 |
| රූප සටහන 2.10 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ - කම්කරු දෙපා............................................................................. | 40 |
| රූප සටහන 2.11 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම - කම්කරු දෙපා............................................................................. | 40 |
| රූප සටහන 2.12 | නිවේදන යැවීමේ ප්‍රගතිය - (සේ. අ. අ.) - කම්කරු දෙපා.................. | 42 |

**ඡායාරූප නාමාවලිය**


| | | |
|---|---|---|
| ඡායාරූපය 2.1 | ජාතික කම්කරු උපදේශන සභාව රැස්වීම....................................... | 20 |
| ඡායාරූපය 2.2 | කම්කරු නීතිය ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ කතිකාවත.................... | 21 |
| ඡායාරූපය 2.3 | විදේශ රැකියාවක නිරත වෙමින් සිටියදී අනතුරකට පත්ව ආබාධිත වූ ශ්‍රමිකයෙකුට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුග්‍රහයෙන් නව නිවසක් ලබා දීම ................................................. | 26 |
| ඡායාරූපය 2.4 | රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන කර එළිදැක්වීම ........................................................ | 28 |
| ඡායාරූපය 2.5 | විගමනික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය................. | 29 |
| ඡායාරූපය 2.6 | සෞදි අරාබි මහකොමසාරිස් සමඟ හමුව ....................................... | 32 |
| ඡායාරූපය 2.7 | ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම ..................................... | 41 |
| ඡායාරූපය 2.8 | ශ්‍රම සංක්‍රමණය සම්බන්ධයෙන් වන පර්යේෂණ වාර්තා එක් කරමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සකස් කළ පර්යේෂණ වාර්තා සංග්‍රහයක් අමාත්‍යවරයා වෙත පිළිගැන්වීම .................................... | 51 |
| ඡායාරූපය 2.9 | ඩිප්ලෝමා සම්මාන ප්‍රධානෝත්සවය - ජා.ශ්‍ර.අ.ආ. ........................... | 56 |
| ඡායාරූපය 2.10 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය - ජා. වෘ. සු. හා සෞ. ආ. .......................................................................... | 57 |
| ඡායාරූපය 2.11 | අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ප්‍රදානය - ශ්‍ර.වා.අර........................................................................ | 63 |
| ඡායාරූපය 3.1 | ගරු අමාත්‍යතුමා හා ජපාන නියෝජිත හමුව.................................... | 73 |

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම

## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂණය, කාර්මික සාමය තහවුරු කිරීම සහ විදේශීය රැකියා වෙළඳපොළ සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම, රැකියාගත කිරීම, රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ රට තුළ ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් දේශීය හා විදේශීය ශ්‍රම බලකාය ආර්ථික සංවර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වේ. මෙම මෙහෙවර ඉටු කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් මත පිහිටා 2022.07.22 දිනැති අංක 2289/43 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැඩසටහන් පෙළ ගස්වා ඇත.

## 1.2 දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

දෙස් විදෙස් රැකියා වෙළඳපොළ වෙත නිපුණ මානව සම්පත සැපයීම සහ කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

## 1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් මත පිහිටා කම්කරු හා විදේශ රැකියා විෂයන්ට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. රැකියා නියුක්තිය සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
3. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා, ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
4. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම
5. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීම
6. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම
7. කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු

8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම

9. ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

10. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩිදියුණු කිරීමට අදාළ ආයතන සමඟ කටයුතු කිරීම

11. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වාදීම

12. විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම

13. විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

14. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තීමය ගැටලුවලට පිළියම් ලබාදීම, ආරක්ෂාව සහ සුභසාධනය පවත්වා ගැනීම

15. විදේශ රටවලදී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබා ගැනිමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම

16. විදේශ රැකියා නියෝජිත ආයතන නියාමනය

17. අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම

18. කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම සහ ශ්‍රම වාසනා අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා ආයතනයන් අධීක්ෂණය

## 1.4 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### 1.4.1 පාලන සහ ආයතන අංශය

අමාත්‍යාංශයේ පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල සම්බන්ධීකරණ හා ආයතනික කටයුතු සහ මානව සම්පත් කළමනාකරණය හා ඒ ආශ්‍රිත රාජකාරි මේ යටතේ සිදු වේ. ඒ අනුව, පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලබයි.

- අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ගරු අමාත්‍යතුමන්ලාගේ සහාය කාර්ය මණ්ඩලයට අදාළ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතන කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම
- අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අමාත්‍යාංශ මට්ටමින් සිදුකළ යුතු ආයතන හා පරිපාලන කටයුතු

- අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියා කිරීම
- උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම, ජනාධිපති කාර්යාලය හා අගමැති කාර්යාලය මඟින් යොමු කරන මහජන පැමිණිලි මෙන්ම සෘජුවම ලැබෙන මහජන ගැටලු අදාළ අංශ වෙත යොමු කිරීම
- අමාත්‍යාංශයේ වාහන පරිපාලනය, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, පුහුණු කටයුතු, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම

### 1.4.2 සංවර්ධන අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම හා කම්කරු ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම සහ විගමනික ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් මෙන්ම අදාළ අණ පනත්, රෙගුලාසි, මාර්ගෝපදේශ සැකසීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු මෙම අංශය විසින් ඉටු කරනු ලබයි.

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු ප්‍රඥප්තීන්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය නියමිත කාල වකවානුව තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකාව කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම
- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටලු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම
- නව නීති ඇති කිරීම හා පවත්නා නීති කාලානුරූපව සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සහාය ලබාදීම
- නව අවබෝධතා ගිවිසුම් / එකඟතාවලට එළඹීම, ගිවිසුම් යාවත්කාලීන කිරීම, ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව පසු විපරම් කිරීම
- ඒකාබද්ධ කමිටු රැස්වීම්වලට අදාළ කටයුතු සහ කලාපීය / ගෝලීය සංවාද හා සම්බන්ධ සියලු  කටයුතු
- ක්ෂේත්‍රයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ (විදේශ රැකියා) විෂයානුබද්ධ පුහුණුව සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ සංචිතය පවත්වාගෙන යාම
- සංවර්ධන නිලධාරීන් හරහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විගමනික ශ්‍රමික කාන්තාවන් හා සම්බන්ධ පවුල් පසුබිම් වාර්තා පිළිබඳව අභියාචනා කමිටු පැවැත්වීම, කමිටු තීරණ දන්වා යැවීම හා පසුවිපරම් කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා වැඩකරන කරන ජනතාව පදිංචි ප්‍රදේශ තුළදීම ජංගම සේවා වැඩසටහන් සංවිධානය කිරීම
- විදේශ කටයුතු අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන මඟින් වරින්වර ඉල්ලීම් කරනු ලබන විගමනික ක්ෂේත්‍රය හා සම්බන්ධ ගැටලු, යෝජනා සහ අනෙකුත් වාර්තා ලබා දීම
- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීමට ක්‍රියා කිරීම

### 1.4.3 සැලසුම් හා අධීක්ෂණ අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම ප්‍රධාන කාර්යභාරය වන අතර පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලබයි.

- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම සහ මාසිකව හා කාර්තුමය වශයෙන් ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම
- ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් මඟින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ද සහාය සහිත ව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් සැලසුම්කරණය, අධීක්ෂණය සහ වාර්තාකරණය
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම හා ඉදිරිපත් කිරීම
- වාර්ෂිකව කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි අඩංගු ජර්නලයක් ප්‍රකාශයට පත් කිරීම
- අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අයවැය කාරක සභා විවාදය සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම
- විෂයපථයට අදාළව සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ අදාළ පරිදි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
- විවිධ අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් සඳහා අදාළ පරිදි දායකත්වය සැපයීම

### 1.4.4 මූල්‍ය අංශය

වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන වගකීම වේ.

- 01/2020 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පැවැත්වීම
- මූල්‍ය අධිකාරියේ නියෝජිතායතනය සම්බන්ධ වාර්තා සකස් කිරීම සහ මූල්‍ය බලතල පැවරීමේ කටයුතු සිදු කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම
- වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම
- රජයේ ගිණුම් පිළිබඳ කාරකසභා වාර්තාව සකස් කිරීම, මහා භාණ්ඩාගාරයට හා අදාළ අනෙකුත් ආයතනවලට මාසිකව හා කාර්තුමය වශයෙන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම

### 1.4.5 අභ්‍යන්තර විගණන අංශය

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ එම ආයතනයන්හි ඵලදායීතාවය යන කරුණු සම්බන්ධයෙන් පවතින දුර්වලතාවයන්, අඩුපාඩු වලක්වා ගැනීම හා අරමුණු ළඟා කර ගැනීම සඳහා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ රජය විසින් නිකුත් කරන චක්‍රලේඛවලට අනුගතවීම සම්බන්ධ මඟ පෙන්වීම සිදු කරනු ලබයි.

රාජ්‍ය ප්‍රතිපත්ති, තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් වෙත ළඟා වීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ගැටලු අවම කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට දායකවීම හා විධිමත් අවංක සේවයක් සාක්ෂාත් කර ගැනීම උදෙසා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් (කාර්තුමය වශයෙන්) පැවැත්වීම, වාර්ෂික විගණන සැලසුම් සැකසීම, අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා විශේෂ පරීක්ෂණයන් පිළිබඳ වාර්තා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම.

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

### 1.5.1 කම්කරු දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම් තහවුරු කිරීම, සමාජ ආරක්ෂණය ඇති කිරීම හා සේව්‍ය සේවක සබඳතාවයන් වර්ධනය කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු විෂයපථයට අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධයෙන් සේව්‍ය සේවක දෙපාර්ශවය වෙත දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශ මගින් සහ දීප ව්‍යාප්තව ස්ථාපිත ප්‍රාදේශීය කාර්යාල මගින් මෙම කාර්යභාරය ඉටු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

- කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මඟින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇති වූ ආරවුල් නිරවුල් කිරීම
- ඵලදායීව කාලීන පරීක්ෂණ සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට අවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මඟින් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම
- සේව්‍ය, සේවක දෙපාර්ශවය තුළ කම්කරු නීති පිළිබඳව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීම
- ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම
- සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය

- කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුලු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම සහ ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම
- වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම
- ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය
- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම

**කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය**




**රූපසටහන 1.1** කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

### 1.5.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් කේන්ද්‍ර කර ගනිමින් 1994 අංක 4 සහ 2009 අංක 56 දරණ පනත් මඟින් සංශෝධිතව 1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද ප්‍රමුඛතම ව්‍යවස්ථාපිත ආයතනයයි. විදේශ රැකියා ක්ෂේත්‍රය පාලනය කිරීම සහ නියාමනය කිරීම, ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය මෙන්ම ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම පිළිබඳ කාර්යාංශය වගකීම දරනු ලබයි. ස්ථිර සේවකයින් 1,131 දෙනෙකුගෙන් යුත් ශ්‍රම බලකායකින් යුතුව මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සහ ජාතික ආර්ථිකයේ දියුණුවට දායක වීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

- විදේශ රැකියා නියෝජිත ආයතන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම / විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම
- විගමනික ශ්‍රමිකයන් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් යොමු කරන ලබන පැමිණිලි විසඳීම
- විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම
- විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නීති බලාත්මක කිරීම
- ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යුහය**




රූපසටහන **1.2 -** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යුහය

### 1.5.3 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ මානව සම්පත සංවර්ධනය කරමින් තරුණ ප්‍රජාව අතර විරැකියාව තුරන් කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා උත්පාදනය තුළින් ජාතික ආර්ථිකයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා 2010.02.12 දිනැති අංක 1640/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2010.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

**ප්‍රධාන කාර්යන්**

- වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු
- ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදා හැරීම
- මහජන රැකියා සේවා කටයුතු
- ජාත්‍යන්තර සම්බන්ධතා
- මානව සම්පත් සංවර්ධනයට අදාළ කටයුතු

### 1.5.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. මෙම ආයතනය ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ නිලධාරින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් පාලනය වේ. කම්කරු අණපනත් නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් වූ ඵලදායී ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලබයි.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ වැඩබිම් ඵලදායිතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් තුන ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි. මෙම විෂය ක්ෂේත්‍රයන් අභ්‍යන්තර අංශ තුනක් මඟින් ක්‍රියාත්මක වන අතර පුහුණු සහ වැඩමුළු, කෙටිකාලීන පාඨමාලා, සහතිකපත් සහ ඩිප්ලෝමා පාඨමාලා වශයෙන් අංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.

**ප්‍රධාන අරමුණු**

- දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධන ක්‍රියාවලියට ක්‍රියාකාරී දායකයන් ලෙස සේවකයින්ගේ යහපැවැත්ම සහතික කිරීමට පියවර ගැනීම
- ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, වාර සඟරා හා පොත් ප්‍රකාශ කිරීම
- ශ්‍රම අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණ, සමීක්ෂණ පැවැත්වීම සහ පාඨමාලා සංවිධානය කිරීම
- පුස්තකාල සහ තොරතුරු සේවා පිහිටුවීම සහ නඩත්තු කිරීම
- සමාන අරමුණු සහිත දේශීය හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමාජ සමඟ සමීප සබඳතාවයක් පවත්වා ගැනීම
- විශ්වවිද්‍යාල සහ ඒවාට අනුබද්ධ ආයතනවල සහාය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය විටෙක සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම
- කාර්මික සාමය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

### 1.5.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් එවක පැවති කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළැකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට මෙම ආයතනය කටයුතු කරන අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක, සේව්‍ය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය ද මෙම ආයතනය විසින් ලබාදෙනු ලබයි.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා**

- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය

- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- පරීක්ෂණාගාරවල වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන

### 1.5.6 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2022 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43කින් සමන්විත වේ.

රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරුවලින් තුවාල ලබන සේවකයින්ට රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරුවලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම ප්‍රධාන අරමුණ වේ. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**ප්‍රධාන කාර්යභාරයන්**

- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2022 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු. 2,000,000/=කි)
- බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරි කිරීම් බැංකුවේ ගිණුම් පවත්වාගෙනයාම හා ඒවායේ පරිපාලන කටයුතු
- සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම
- කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු
- සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම
- ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම

### 1.5.7 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකාව 1966 වසරේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් අනතුරුව ජාතික ඵලදායිතා සංවිධානය (NPO) ස්ථාපිත වූ අතර, මෙම කාර්යය වඩාත් පුළුල් කිරීම සඳහා 1994 වසරේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලදී. මෙමඟින් විවිධ ආයතන වෙත ඵලදායිතා සංකල්ප, මෙවලම් හා තාක්ෂණය හඳුන්වා දෙන ලදී. රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා ප්‍රජා යන අංශ, ඵලදායිතා සංකල්ප තුළින් පෝෂණය කිරීම සඳහා වාර්ෂිකව විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, ආසියානු ඵලදායිතා

සංවිධානයේ (APO) නිරන්තර සහයෝගිතාව තුළින් “දැනුම කේන්ද්‍රික සමාජයක්” බිහිකිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී ඇත.

**ප්‍රධාන කාර්යයන්**

- රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ ප්‍රජා යන අංශ ඉලක්ක කර ගනිමින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිතා විෂයන්ට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - ✓ ඵලදායිතා ඩිප්ලෝමා වැඩසටහන
  - ✓ ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන
  - ✓ ඵලදායිතා කෙටිකාලීන පුහුණු පාඨමාලා වැඩසටහන
  - ✓ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන
- ආයතනවල ඵලදායිතා ප්‍රවර්ධනය සම්බන්ධව උපදේශන සේවාවන් ලබාදීම
- ආසියානු ඵලදායිතා සංගමය හා එක්ව පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - ✓ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම
  - ✓ e learning වැඩසටහන් පැවැත්වීම
  - ✓ තාක්ෂණික විශේෂඥ සේවාවන් ලබාගැනීම තුළින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - ✓ ආදර්ශන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- “5S” සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම

### 1.5.8 ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභසාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන අදායමයි. ඊට අමතරව අරමුදල සතු ස්ථාවර තැන්පතුවලින් උපයන පොලි අදායම ද ඇතුළුව අරමුදල විසින් වාර්ෂිකව සැලසුම් කරන ලද අරමුණුවලට අනුව කම්කරු සුභසාධනය උදෙසා මුළු දිවයිනම ආවරණය වන ආකාරයට විවිධ සුභසාධන වැඩසටහන් සිදුකරනු ලබයි.

**අරමුදලේ අරමුණු**

- සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම
- සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම
- හදිසි අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම
- සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම
- ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම

- සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම
- කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම

### 1.5.9 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම, රජයට අයත් එකම ක්‍රියාත්මක විදේශ රැකියා ඒජන්සි ආයතනය වන අතර විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයීය පරිපාලිත ආයතනයක් වශයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ 1996 ඔක්තෝබර් මාසයේ සිට ස්ථාපිත ක්‍රියාත්මක ආයතනයතකි. 2013 වසරේදී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම ISO9001:2008 තත්ව සහතිකයෙන් පිදුම් ලැබීය.

**ප්‍රධාන කාර්යයන්**

- රැකියා ඇණවුම් සොයා ගැනීම හා මූලික අනුමැතිය ලබා ගැනීම
- රැකියා ඇණවුම්වලට අදාළ ප්‍රචාරයන් සඳහා අනුමැතිය ලබා ගැනීම හා සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීම
- සේවායෝජකයින්ගේ තෝරා ගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීම, රැකියා සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීම උදෙසා සම්මුඛ පරීක්ෂණ හා තත්ව පරීක්ෂණ පැවැත්වීම
- විදේශ රැකියා සඳහා යොමු කිරීමට අදාළ සියලු පරිපාලන කටයුතු හා පහසුකම් සැපයීම සිදු කොට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අවසන් අනුමැතිය ලබාගැනීම සහ පුද්ගලයින් රැකියා සඳහා විදේශ ගත කිරීම

## 1.6 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය

වගුව **1-1** 2023.09.30 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **අනුමත සංඛ්‍යාව** | **සේවයේ නියුක්ත සංඛ්‍යාව** | **අනුමත සංඛ්‍යාව** | **සේවයේ නියුක්ත සංඛ්‍යාව** | **අනුමත සංඛ්‍යාව** | **සේවයේ නියුක්ත සංඛ්‍යාව** | **අනුමත සංඛ්‍යාව** | **සේවයේ නියුක්ත සංඛ්‍යාව** | **අනුමත සංඛ්‍යාව** | **සේවයේ නියුක්ත සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය** |
| 1 | අමාත්‍යාංශ කාර්යාලය - කම්කරු අංශය | 20 | 17 | 03 | 01 | 73 | 51 | 35 | 25 | 132 | 97 | 27% |
| 2 | කම්කරු දෙපාර්තමේන්තුව | 211 | 131 | 668 | 473 | 1,753 | 1,722 | 489 | 412 | 3,121 | 2,738 | 12% |
| 3 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 20 | 12 | 05 | 01 | 626 | 598 | 15 | 05 | 666 | 616 | 9% |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 9 | 3 | 13 | 3 | 18 | 7 | 5 | 2 | 45 | 15 | 66% |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 7 | 2 | 3 | 3 | 10 | 6 | 5 | 5 | 25 | 16 | 36% |
| 6 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 5 | 2 | 2 | 1 | 31 | 31 | 5 | 2 | 43 | 36 | 16% |
| 7 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 17 | 8 | 4 | 2 | 792 | 718 | 19 | 10 | 832 | 738 | 11% |
| 8 | ශ්‍රම වාසනා අරමුදල | 01 | 01 | 04 | 03 | 08 | 05 | 04 | 03 | 17 | 12 | 29% |
| 9 | අමාත්‍යාංශ කාර්යාලය - විදේශ රැකියා අංශය | 11 | 9 | 2 | 1 | 1,024 | 1,001 | 21 | 14 | 1,058 | 1,025 | 3% |
| 10 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 137 | 96 | 197 | 166 | 692 | 642 | 251 | 226 | 1,277 | 1,130 | 12% |
| 11 | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම | 4 | 4 | 9 | 7 | 10 | 5 | 7 | 8 | 30 | 24 | 20% |
| | **එකතුව** | **442** | **285** | **901** | **654** | **5,027** | **4,781** | **849** | **712** | **7,246** | **6,442** | **11%** |